# දැන්වීමයි

## කළමනාකරණ හා මූල්‍ය පීඨ ශිෂ්‍ය සංගමයේ නිලවරණය

කළමනාකරණ හා මූල්‍ය පීඨ ශිෂ්‍ය සංගමයේ නිලධාරීන් හා වෙනත් සභිකයින් පත් කර ගැනීමේ නිලවරණය පැවැත්වීම සදහා පහත දැක්වෙන දිනය, කාල පරිච්ඡේදය හා ස්ථානය කොළඹ විශ්වවිද්‍යාලයේ උප කුලපති තුමා විසින් නියම කොට ඇත.

**දිනය** : 2024 මාර්තු මස 15 වන දින

**කාල පරිච්ඡේදය** : පෙ.ව 09.30 සිට ප.ව 1.00

**ස්ථානය** : කළමනාකරණ හා මූල්‍ය පීඨය
(පීඨාධිපති කාර්යාලය)

**වජිරා හපුහින්න ජයරත්න**
වැඩබලන ලේඛකාධිකාරී
කොළඹ විශ්වවිද්‍යාලය.
කොළඹ 03.

2024 පෙබරවාරි මස 21 වන දින

# දැන්වීමයි

## කළමනාකරණ හා මූල්‍ය පීඨ ශිෂ්‍ය සංගමයේ නිලවරණය

කොළඹ විශ්වවිද්‍යාලයේ උප කුලපති විසින් කළමනාකරණ හා මූල්‍ය පීඨ ශිෂ්‍ය සංගමයේ නිලධාරීන් හා වෙනත් සභිකයින් පත් කිරීම සඳහා පැවැත්වෙන නිලවරණයේ නිලවරණ නිලධාරියා වශයෙන් කළමනාකරණ හා මූල්‍ය පීඨයේ පීඨාධිපති පත් කර ඇත.

කළමනාකරණ හා මූල්‍ය පීඨ ශිෂ්‍ය සංගමයේ නිලධාරීන් හා වෙනත් සභිකයින් තෝරා පත් කර ගැනීම සඳහා යථෝක්ත නිලවරණ නිලධාරියා විසින් නාම යෝජනා භාර ගැනීමේ දිනය, කාල පරිච්ඡේදය හා ස්ථානය ද උප කුලපති විසින් නියමකොට ඇත.
නාම යෝජනා පත්‍ර කළමනාකරණ හා මූල්‍ය පීඨ පීඨාධිපති කාර්යාලයෙන් පමණක් ලබා ගත යුතුය.

| | | |
|---|---|---|
| දිනය | : | 2024 මාර්තු 06 වන දින |
| කාලය | : | පෙ.ව. **10.00 - 11.00** |
| ස්ථානය | : | කළමනාකරණ හා මූල්‍ය පීඨ පීඨාධිපති කාර්යාලය |

1989 අංක 01 දරණ ශිෂ්‍ය සංගම් අතුරු ව්‍යවස්ථාවේ පළමු වන උප ලේඛනයේ දක්වා ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව සම්පූර්ණ කරන ලද නාම යෝජනා පත්‍ර යථෝක්ත දිනයේ උක්ත කාලපරිච්ඡේදය තුළ ඉහත සඳහන් ස්ථානයේදී සුදුසුකම් ඇති ශිෂ්‍යයින්ගෙන් නිලවරණ නිලධාරී විසින් භාර ගනු ලැබේ.

20/02/24

**වජිරා හඳුභින්න ජයරත්න**
වැඩබලන ලේඛකාධිකාරී
කොළඹ විශ්වවිද්‍යාලය.
කොළඹ 03.

2024 පෙබරවාරි මස 21 වන දින

# දැන්වීමයි

## කොළඹ විශ්වවිද්‍යාලයේ කළමනාකරණ හා මුල්‍ය පීඨ ශිෂ්‍ය සංගමය

1989 අංක 01 දරණ ශිෂ්‍ය සංගම් අතුරු ව්‍යවස්ථාවේ 6 වන වගන්තිය ප්‍රකාර කොළඹ විශ්වවිද්‍යලයේ කළමනාකරණ හා මුල්‍ය පීඨ ශිෂ්‍ය සංගමයට පත් කළ යුතු නිලධාරීන්ගේ පදවි හා වෙනත් සභිකයින්ගේ සංඛ්‍යාව පහත සඳහන් වේ.

අ. ශිෂ්‍ය සංගමයේ නම
"කළමනාකරණ හා මුල්‍ය පීඨ ශිෂ්‍ය සංගමය"

ආ. කළමනාකරණ හා මුල්‍ය පීඨ ශිෂ්‍ය සංගමය සඳහා තෝරා පත් කර ගත යුතු සභිකයින්ගේ සංඛ්‍යාව හා නිලධාරීන්ගේ පදවි

**1.සභාපති**
**2.උප සභාපති**
**3.ලේකම්**
**4.සංස්කාරක**
**5.කණිෂ්ඨ භාණ්ඩාගාරික**
**6.සභිකයින් අට (08) දෙනෙකු**

කළමනාකරණ හා මුල්‍ය පීඨ ශිෂ්‍ය සංගමය සඳහා සුදුසුකම් ලබන ඡන්ද දායකයින්ගේ නාම ලේඛනයක් කළමනාකරණ හා මුල්‍ය පපීඨයේ පීඨාධිපති කාර්යාලයේ ඇත.

**වජිරා හපුආරච්චි ජයරත්න**
වැඩබලන ලේඛකාධිකාරි
කොළඹ විශ්වවිද්‍යාලය.
කොළඹ 03.

2024 පෙබරවාරි මස 21 වන දින